**03-01-2021 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1987/10/05**

**බ්‍රහ්මින් ජීවිතයේ සතුට, තෘප්තිය සහ සැහීමට පත්වීම.**

අද, ඔහුගේ උපරිම ලෙස ආදරණීය, බොහෝ කලක් නැතිව සිට දැන් හමු වූ බ්‍රහ්මින් දරුවන් අතරින්, බාප්දාදා විශේෂයෙන් බලන්නේ, බ්‍රහ්මින් දිවියේ විශේෂත්ව වලින් පිරි දරුවන් දෙසයි. අද දින, අම්රිත් වේලාවේ බ්‍රහ්මින් වංශයේ සැරසිල්ල වන සියලුම දරුවන් අතරින්, තෘප්තිමත්කම ඇති සහ සෑම විටම තමන් තෘප්තිමත්ව සිටිමින්, තම දෘෂ්ඨියෙන්, ආකල්පයෙන් සහ ක්‍රියා තුළින් අන් අයට නොකඩවා තෘප්තියේ අත්දැකීම ලබා දෙන, එම විශේෂ ජීවාත්මයන්ව බාප්දාදා තෝරා ගනිමින් සිටියා. එබැවින් අද, තම සියලු සිතිවිලි, වදන් සහ ක්‍රියා මෙන්ම, සමූහය තුළ නෑ සබඳතා වලදී සහ ඔවුන්ගේ සෑම ක්‍රියාවකම, නිරන්තරයෙන් බාප්දාදාගේ තෘප්තියේ ස්වර්ණමය මල් වැස්ස අත්දකින, එවන් තෘප්තිමත් මැණික් වලින් බාප්දාදා මාලාව අමුණමින් සිටියා. ඔවුන් නිරතුරුවම අන් අය මත තෘප්තියේ ස්වර්ණමය මල් වස්සයි. සෑම තැනකම සිටින සියලුම ජීවාත්ම අතරින්, එවන් තෘප්තිමත් ජීවාත්ම ටික දෙනෙක් පමණක් දිස්විය. පිළියෙල කරන ලද මාලය විශාල නොවීය එය කුඩා මාලාවක් විය. තෘප්තිමත් මැණික් මාලාව දෙස නැවත නැවතත් බලමින් බාප්දාදා සතුටු වුණේ, බාප්දාදාගේ ගෙල වටා මාලය බවට පත් වන්නේ එවන් තෘප්තියේ මැණික් පමණක් නිසාය. ඔවුන් රාජධානියට අයිතියක් හිමි කරගන්නා අතර බැතිමතුන් හුමණය කරන මාලාවේ පබළු බවටද පත් වෙයි.

ඇතැම් විට තෘප්තිමත්ව සිටින සහ ඇතැම් විටෙක අතෘප්තිමත් සිතිවිල්ලක ඉතා සුළු ඡායාවක් යටතට පැමිණ ඉන්පසුව ඉන් ඉවත් වන, අනෙක් දරුවන් දෙසත් බාප්දාදා බලමින් සිටියා ඔවුන් එය තුළ සිර වන්නේ නැහැ. තුන්වන වර්ගයේ දරුවන්ට ඇතැම් විට තම සිතිවිලි තුළ අතෘප්තිය තිබෙයි ඔවුන් ඇතැම් විට තමන් සමග අතෘප්තිමත් වෙයි, ඇතැම් විට අහිතකර සිදුවීම් සමග අතෘප්තිමත් වෙයි, සමහර විට තමන්ගේම චංචලත්වය නිසා අතෘප්තිමත් වෙයි, තවත් විටෙක විශාල හෝ කුඩා සිදුවීම් සමග අතෘප්තියට පත් වෙයි. ඔවුන් මෙම චක්‍රය තුළ සිර වන අතර ඉන්පසුව ඉන් මිදී, පසුව නැවතත් එය තුළ සිර වෙයි. බාබා එවන් මාලාවක්ද දුටුවා. එබැවින් මාලා තුනක් පිළියෙල කෙරුණා. සියල්ලම මැණික් වන නමුත් තෘප්තියේ මැණික් වන අයගේ දීප්තිය සහ අනෙක් වර්ග දෙකේ මැණික් වල දීප්තිය කෙබඳු වෙයිද කියා ඔබටද වටහාගත හැක. මාලා තුන දෙසම නැවත නැවතත් බලමින් බ්‍රහ්ම පියා සතුටු වූ අතර ඒ සමගම දෙවන අංකයේ මාලාවේ මැණික්, ප්‍රථම අංකයේ මාලාවට ගෙන ඒමට තැත් කරමින් සිටියා. හදවතට සමීප කතා බහක් සිදුවෙමින් තිබුණා, මන්ද, දෙවන මාලාවේ සමහර පබළු වලට, අතෘප්තියේ සුළු ඡායාවක් නිසා පළමු මාලාවේ සිටීම අහිමි විය, එබැවින් ඔවුන්ව පරිවර්ථනය කර කෙසේ හෝ පළමු මාලාව තුළට ගෙන ආ යුතුව තිබේ. සෑම කෙනෙකුගේම ගුණධර්ම, විශේෂතා සහ සේවය ඔහු ඉදිරියේ තබාගෙන, ඔහු නැවත නැවතත් එක දෙයක් පමණක් පැවසුවා අප මේ කෙනාව පළමු මාලාව තුළට ගෙනෙමු. බ්‍රහ්ම පියා, ඔවුන් ගැන විශේෂ හදවතට සමීප කතා බහක යෙදුණු, එවන් මැණික් 25ක් හෝ 30ක් සිටියා. බ්‍රහ්ම පියා පැවසුවේ මෙම පබළුද අංක එක මාලාවට දැමිය යුතුයි. කෙසේවෙතත්, ඔහු ඉන්පසුව සිනහසී පැවසුවේ, පරම පියා අනිවාර්යෙන් ඔවුන්ව පළමු මාලාවට ගෙන එන බවයි. එවන් විශේෂ මැණික්ද සිටියා.

එවන් හදවතට සමීප කතාබහක් සිදුවන අතර තුර, අතෘප්තියට විශේෂිත වූ හේතුව පිළිබඳව එක දෙයක් ඉස්මතු විය. සංගම යුගයේ විශේෂ ආශිර්වාදය තෘප්තිමත් බව බැවින්, ආශිර්වාද පිරිනමන්නාගෙන් මෙම ආශිර්වාදය ලබා ගෙන ඇති ජීවාත්ම, දෙවන මාලාවට පැමිණෙන්නේ ඇයි? තෘප්තියේ බීජය වන්නේ සියලු ලැබීම් තිබීමයි. අතෘප්තියේ බීජය වන්නේ, යම් භෞතික හෝ සූක්ෂම ලැබීමක අඩුවකි. බ්‍රහ්මනයන්ගේ සම්පත් ගබඩාවේ හෝ ජීවිතවල කිසිම අඩුවක් නොමැති බව, බ්‍රහ්මනයන් පිළිබඳව සිහි කර ඇති බැවින්, එසේ නම් අතෘප්තිය තිබෙන්නේ ඇයි? ඔහු ලබා දෙන ආශිර්වාද වල, ආශිර්වාද පිරිනමන්නා වෙනසක් සිදුකර තිබෙනවාද, නැතහොත් ආශිර්වාද ලබා දී ඇති අය, ලබා ගන්නා දේහි වෙනසක් සිදුකර තිබෙනවාද? සිදුවුණේ කුමක්ද? ආශිර්වාද පිරිනමන්නාගේ සම්පත් ගබඩාව මෙන්ම පිරිනමන්නාද, පිරිපුන්ය. එය කෙතරම් පිරී තිබේද යත් ඔබගේ රජ පෙළපත උපත් 21ක් පවතී, එනම්, දීර්ඝ කාලයක් පුරා බීකේවරු වී ඇති ශ්‍රේෂ්ඨ උපකරණ ජීවාත්මයන්ගේ රජ පෙළපත සහ බැතිමතුන්ගේ පෙළපතද පැවතෙන්නේ, මෙම ලැබීම් වල පදනමට අනුවයි. මෙතරම් මහා ලැබීම් ඇති විට, අතෘප්තිය තිබෙන්නේ ඇයි? සියලු දෙනාටම එකම අසීමිත

සම්පත්, එකම වෙලාවේ සහ එකම ක්‍රමවේදය තුළින් ඒකායන කෙනාගෙන් ලැබී තිබේ. කෙසේවෙතත්, ඔබට ලැබී ඇති සම්පත් ඔබ සැම විටම භාවිත නොකරයි, එනම්, ඔබ ඒවා ඔබගේ අවධානයේ තබා නොගනී. ඒවා ගැන කතා කරන විට ඔබ සතුටු වන නමුත් ඔබගේ හදවතින් ඔබ සතුටු නැත. බුද්ධිමය වශයෙන් සතුට තිබෙන නමුත් හදවතේ සතුට නොමැත. හේතුව කුමක්ද? ඔබ ලැබීම්වල සම්පත්, එම අවධානයේ ප්‍රතිමූර්තියක් ලෙස භාවිත නොකරයි. ඔබට ඒවායේ අවධානය තිබෙන නමුත් ඔබ එම අවධානයේ ප්‍රතිමූර්තියක් වන්නේ නැත. ලැබීම අසීමිත නමුත් ඔබ ඇතැම් විටෙක එය සීමිත කරගනී, මේ නිසා යම් සීමිත ලැබීමකට ඇති ආශාව, අසීමිත ලැබීමේ ප්‍රතිඵලය වන නිරන්තර තෘප්තියේ අත්දැකීම ඔබට අහිමි කරවයි. සීමිත ලැබීම් ඔබගේ හදවතට සීමා දමයි. ඔබ අතෘප්තිය අත්දකින්නේ මේ නිසයි. ඔබ එවිට සේවය තුළට සීමාවන් ගෙන එයි, මන්ද සීමිත ආශාවන්ගේ ඵලය වන්නේ ඔබට අවශ්‍ය ඵලය නොලැබීමය. සීමිත ආශාවන්ගේ ඵලය, තාවකාලික කාලයකට පමණක් සතුට ලබා දෙයි. මේ නිසයි ඇතැම් විටෙක තෘප්තියත්, තවත් විටෙක අතෘප්තියත් තිබෙන්නේ. සීමාවන්, ඔබට අසීමිත කුල්මත් බව අත්විඳින්නට ඉඩ නොදෙයි. එබැවින් ඔබට මනසේ තෘප්තිය තිබේද කියා විශේෂයෙන් පරීක්ෂා කර බලන්න, එනම්, තමන් සමග තෘප්තිය සහ අන් අය සමග තෘප්තිය.

ජීවාත්ම තුළ තෘප්තිමත්කම තිබීමේ සලකුණ වන්නේ ඔවුන්ගේ මනසේ, හදවතේ, සියලු දෙනා සමග, පරම පියා සමග සහ නාටකය සමග ඔවුන් තෘප්තිමත් වීමය. කිසියම් අහිතකර සිදුවීමක් පැන නැඟුනත්, ඇතැම් ජීවාත්ම ඔවුන්ගේ කර්ම ගිණුම් පියවීම සඳහා ඔවුන්ට විරුද්ධ වීමට පැමිණියත්, සිරුරට යම් කර්මයේ කායික විඳවීමක් යන මේ කුමක් පැමිණියත්, ඔවුන්ගේ මනසේ සහ සිරුරේ තෘප්තියේ රළ පෙනෙන්නට තිබෙයි. සීමිත ආශාවන්ගෙන් නිදහස් ජීවාත්ම, තෘප්තිමත් නිසා, තෘප්තියේ දීප්තියෙන් බැබලෙන තාරකා ලෙසින් ඔවුන් දිස් වෙයි. සෑහීමට පත්වන අය, කිසිම අවස්ථාවකදී ප්‍රශ්න නොඅසයි. ඔවුන් සෑහීමට පත්ව සිටින විට, ඔවුන්ට ප්‍රශ්න නොමැත. සෑහීමට පත් අයගේ සලකුණ වන්නේ ඔවුන් සැම විටම පරහිතකාමී වන අතර සියලු දෙනාම නිදොස් බව ඔවුන්ට හැඟෙයි. ඔවුන් කිසිවෙක් මත වරද පටවන්නේ නැත. ඔවුන්ට එවන් භාග්‍යයක් නිර්මාණය කිරීම ගැන, ඔවුන් භාග්‍යය පිරිනමන්නා මත වරද පටවන්නේ නැත නාටකයේ තමන්ගේ චරිත කොටස් මෙබඳු බව කියමින්, ඔවුන් නාටකයට දොස් පවරන්නේ නැත ඔහුගේ ස්වභාවය සහ සංස්කාර එවැනි අන්දමේ බව කියමින්, ඔවුන් කිසිම පුද්ගලයෙකු මත වරද පටවන්නේ නැත වාතාවරණය මෙබඳු බව පවසා ඔවුන් සොබා දහමට දොස් පවරන්නේ නැත තම සිරුරු එවන් ආකාරයේ වීම නිසා ඔවුන් තම සිරුරට දොස් පවරන්නේ නැත. සෑහීමට පත් වීම යනු, නිරන්තරයෙන් පරහිතකාමී වී කිසිවෙකුට දොස් පැවරීමෙන් නිදහස් වූ දෘෂ්ටියක් සහ ආකල්පයක් තිබීමය. එබැවින් සංගම යුගයේ විශේෂත්වය තෘප්තිමත් බව වන අතර තෘප්තිමත් බවේ සලකුණ වන්නේ සෑහීමට පත්ව සිටීමයි. බ්‍රහ්මින් දිවියේ විශේෂ ලැබීම මෙයයි. ඔබට තෘප්තිය සහ සෑහීමට පත් වීම නොමැති නම්, එවිට ඔබ බ්‍රහ්මින් ජීවිතයේ ප්‍රයෝජනය ලබාගෙන නැත. බ්‍රහ්මින් ජීවිතයේ සතුට වන්නේ තෘප්තිය සහ සෑහීමට පත් වීමය. ඔබ බ්‍රහ්මින් ජීවිතයක් ගත කරන නමුත් එහි සතුට අත්විඳින්නේ නැතිනම්, එවිට ඔබ නමින් පමණක් බ්‍රහ්මින් කෙනෙකි, එසේ නැත්නම් ඔබ ලැබීමේ ප්‍රතිරූපයක් වන බ්‍රහ්මින් කෙනෙක්ද? එබැවින් බාප්දාදා ඔය සියලුම බ්‍රහ්මින් දරුවන්ට මතක් කර දෙන්නේ ඔබ බ්‍රහමනයන් බවට පත් වී ඇති අතර එය මහා භාග්‍යයකි. කෙසේවෙතත්, බ්‍රහ්මින් දිවියේ උරුමය සහ දේපළ වන්නේ තෘප්තිය වන අතර බ්‍රහ්මින් දිවියේ පෞරුෂත්වය වන්නේ සෑහීමට පත්වීමය. කිසිම විටෙක තමන්ට මෙම අත්දැකීම අහිමි කරනොගන්න. එයට අයිතියක් ඔබට තිබේ. විවෘත හදවතකින් පිරිනමන්නා සහ ආශිර්වාද පිරිනමන්නා ඔබට ලැබීම්වල සම්පත් ලබා දෙන බැවින්, ඔහු මේවා දැනටමත් ඔබට ලබා දී ඇති බැවින්, එසේ නම්, ඔබගේ දේපළ සහ පෞරුෂත්වය ඔබ මුළුමනින්ම අත්විඳිය යුතුයි. එමෙන්ම අන් අයට එය අත්විඳීමටත් ඔබ මඟ පෑදිය යුතුයි. ඔබට වැටහෙනවාද? ඔය සැම කෙනෙකුටම තමන්ගෙන් මෙසේ විමසිය හැක මා සිටින්නේ කුමන අංක මාලාවේද? ඔබ සියලු දෙනාම මාලාවක සිටින නමුත් ඔබ සිටින්නේ කුමන අංකයේ මාලාවේද? අච්චා.

අද එය රාජස්ථාන් සහ යූපී කණ්ඩායම් වල වාරයයි. රාජස්ථාන් යනු රාජධානියක (පාලනය කිරීමේ) සංස්කාර ඇති අයයි, ප්‍රායෝගික අන්දමකින් පාලනය කිරීමේ සංස්කාර ඔවුන්ගේ සැම සිතිවිල්ලකට සහ ස්වරූපයට දමන අයයි, එනම්, ඒවා හෙළිදරව් කරන අයයි. රාජස්ථාන්හි වැසියෙක් වීම යනු මෙයයි. ඔබ මෙවැනි කෙනෙක් නේද? ඔබ ඇතැම් විටෙක පුරවැසියන් වන්නේ නැහැ නේද? ඔබ බලපෑමකට යට වන්නේ නම් ඔබ පුරවැසියන් ලෙස හැඳින්වෙයි ඔබ පාලකයා නම් එවිට ඔබ රජුය. ඇතැම් විටෙක ඔබ පුරවැසියෙක් වන අතර ඇතැම් විටෙක ඔබ රජ කෙනෙක් වීම සිදු නොවිය යුතුයි නැහැ. සැම විටම ඔබගේ සංස්කාර වල ස්වභාවිකවම

පාලනය කිරීමේ සංස්කාර පවත්වා ගන්න. රාජස්ථාන්වල වැසියන් වන එවන් දරුවන්ට විශේෂ වැදගත්කමක් තිබේ. සැම කෙනෙක්ම රජ කෙනෙක් දෙස බලන්නේ උසස් දෘෂ්ඨියකින්, එමෙන්ම ඔවුන් සැම විටෙකම රජ කෙනෙකුට උසස් ස්ථානයක් ලබා දෙයි. රජ කෙනෙක් සැම විටෙකම සිහසුනක් මත අසුන් ගන්නා අතර පුරවැසියන් ඔහුට පහළින් අසුන් ගනී. එබැවින් පාලනය කිරීමේ සංස්කාර ඇති රාජස්ථාන් වලින් පැමිණි ජීවාත්ම, සැම විටම උසස් මනෝ ස්ථිතියක් යන උස ස්ථානයේ සිටින අයයි. ඔබ දැනටමත් ඒ ආකාරයට පත්ව සිටින්නේද නැත්නම් ඔබ එය බවට පත් වෙමින් සිටිනවාද? ඔබ එය බවට පත්ව ඇති අතර ඔබ අනිවාර්යෙන් පරිසමාප්ත විය යුතුයි. රාජස්ථාන්හි වර්ණනාවද අඩු නැත. මෙම ආයතනයේ මූලස්ථානය පිහිටා තිබෙන්නේ රාජස්ථාන්වලයි. එබැවින් ඔබ ශ්‍රේෂ්ඨයි, එහෙම නේද? ඔබ නමින් ශ්‍රේෂ්ඨයි, එමෙන්ම ඔබගේ කාර්යයෙන්ද ශ්‍රේෂ්ඨයි. එවන් රජවරුන්ගේ දේශයක(රාජස්ථාන්) දරුවන්, ඔවුන්ගේ නිවසට ඇවිත්. ඔබට වැටහෙනවාද?

උත්තර් ප්‍රදේශයේ භූමිය, පිවිතුරු දේශයක් ලෙස විශේෂයෙන් සිහි කර තිබේ. සියලු දෙනාව පිවිතුරු කරන ගංගා නදියද එහි තිබෙන අතර, භක්තියට අනුව, ක්‍රිෂ්ණාගේ දේශය තිබෙන්නේද යූපී වලයි. එම දේශය පිළිබඳ බොහෝ වර්ණනා තිබේ. ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියාකාරම් දැක ගැනීමට හෝ ඔහුගේ ජන්ම ස්ථානය බැලීමට අවශ්‍ය නම්, ඔවුන් යූපී වලට යයි. එබැවින් යූපී වල අයගේ විශේෂත්වය වන්නේ, නිරන්තරයෙන් පිවිතුරුව සිටීම සහ අන් අයව පිවිතුරු කරවීමයි. පරම පියාගේ ප්‍රශංසාව වන්නේ ඔහු පාරිශුද්ධකරු වන සේම, යූපී වල අයගේ ප්‍රශංසාවද පියාට සමානය. ඔබ පාරිශුද්ධකරු ජීවාත්මයි. භාග්‍යයේ තාරකාව දිදුලනවා. එතරම් භාග්‍යවන්ත ස්ථානයක් සහ ස්ථිතියක ප්‍රශංසාව තිබේ. ඔබගේ මනෝ ස්ථිතියේ ප්‍රශංසාව වන්නේ 'සැම විටම පිවිතුරුයි'' යන්නයි. එබැවින් ඔබ මේ ආකාරයට භාග්‍යවන්ත බව ඔබ සලකනවාද? ඔබ සැම විටම සතුටින් සිටින අයයි. ඔබගේ භාග්‍යය දැක, සැම විටම ප්‍රබෝදමත්ව සිටින්න. ඔබම ප්‍රබෝදමත්ව සිට අන් අයවත් නොකඩවා ප්‍රබෝදමත් කරවන්න, මන්ද, ප්‍රබෝදමත් මුහුණක් ඉබේටම ආකර්ෂණය කරන මුහුණකි. එය, තමන් වෙතට මිනිසුන් ආකර්ෂණය කරගන්නා භෞතික ගඟක් වැනිය. වන්දනාකරුවන් එහි යාමට ආකර්ෂණය වෙයි. කෙතරම් අපහසුතා වලට ඔවුන්ට මුහුණ දීමට සිදුවුණත්, පිවිතුරු වීමේ ආකර්ෂණයෙන් ඔවුන් ඇදී යයි. එසේනම්, අන් අයව පිවිතුරු කරවීමේ කාර්යයේ සිහිවටනය තිබෙන්නේ යූපී වලයි. ඒ ආකාරයෙන්ම ප්‍රබෝදමත් වී ආකර්ෂණයේ ප්‍රතිරූවක් වන්න. ඔබට වැටහෙනවාද?

තුන්වන කණ්ඩායම, ද්විත්ව විදේශිකයන්ය. ද්විත්ව විදේශිකයන් යනු, ඔබ සමාන නිසා, සැම විටම විදේශිකයා වන පරම පියාව, ආකර්ෂණය කරන අයයි. පරම පියා විදෙස් දේශයකින් වන අතර ඔබද විදෙස් රටවලින්ය. තම සම අය කෙරෙහි සෙනෙහස තිබේ. දෙමාපියන්ටත් වඩා මිතුරන් කෙරෙහි සෙනෙහස තිබේ. එබැවින් ද්විත්ව විදේශිකයන් පියා වැනිය සැම විටෙකම සිරුරට සහ සිරුරේ ආකර්ෂණයට ඔබ්බෙන් සිටින අය. ඔබ විදේශිකයන්, අශාරීරිකයි එමෙන්ම අව්‍යක්තයි. එබැවින් ඔහුට සමාන, අශාරීරික සහ අව්‍යක්ත මනෝ ස්ථිතිය ඇති ඔහුගේ දරුවන් දැකීමට පියා සතුටු වෙයි. ඔබ හොඳින් තරඟයේ දිව යනවා. ඔබ සේවය කිරීමේ, විවිධ පහසුකම් භාවිතයේ සහ ඉදිරියට ගමන් කිරීමට විවිධ ක්‍රමවේද භාවිත කිරීමේ හොඳින් තරඟ වදිනවා. ඔබ ක්‍රමවේද භාවිත කරන අතර ප්‍රගතියක්ද ලබනවා. මේ නිසයි බාප්දාදා සැම තැනකින් පැමිණි සියලුම ද්විත්ව විදේශික දරුවන්ට, සේවය වෙනුවෙන් බොහෝ සුබ පැතුම් ලබා දෙන්නේ සහ ඔබ සියලු දෙනාටම ස්ව-ප්‍රගතිය ගැන අවධානයෙන් සිටින ලෙස සිහිකර දෙන්නේ. සැම විටම ඔබගේ ස්ව-ප්‍රගතියේ පියාසර මනෝ ස්ථිතියෙන් නොකඩවා පියාසර කරන්න. තමන්ගේ ස්ව-ප්‍රගතිය සහ සේවයේ ප්‍රගතිය අතර සමබරතාවයක් පවත්වා ගැනීමෙන්, පරම පියාගෙන් ආශිර්වාද ලබා ගැනීමට ඔබට සැම විටම අයිතියක් තිබෙනා අතර ඔබට සැම විටම මෙම අයිතිය තිබෙයි. අච්චා.

ඉතිරි වී ඇති හතර වැනි කණ්ඩායම, මධුබන් නිවැසියන්ය. ඔවුන් සැම විටම සිටින්නේ මෙහිය. හදවතේ(යැරළු) සිටින අය උදුනේ(යැරළුය) සිටියි. උදුනේ සිටින අය, හදවත තුළ සිටියි. නිවැරදි අන්දමට, විනයානුකූලව, උපරිම බ්‍රහ්ම භෝජන පිළියෙල කරන ස්ථානය, මධුබන්ය. මධුබන් වල අය, වඩාත්ම ආදරණීය, බොහෝ කලක් නැතිව සිට දැන් හමු වූ අයයි. සියලුම උත්සව පැවැත්වෙන්නේ මධුබන් වලයි. මුරලි වැඩි ප්‍රමාණයකට සෘජුවම සවන් දෙන්නේ මධුබන් වල අයයි. එබැවින් මධුබන් වල නිවැසියන්, සැම විටම උසස් භාග්‍යයකට අයිතියක් ඇති අයයි. ඔබ සේවය කරන්නේ තම හදවතින්ය. මේ නිසයි මධුබන් නිවැසියන්ට නොකඩවා බාප්දාදා ගෙන් සහ සියලුම බ්‍රහ්මින්වරුන්ගෙන් තම හදවතින්ම ආශිර්වාද ලැබෙන්නේ. අච්චා.

සෑම තැනකින් පැමිණ ඇති බාප්දාදාගේ සියලුම විශේෂ තෘප්තියේ මැණික් වලට, බාප්දාගෙන් විශේෂ සෙනෙහස සහ සිහි කිරීම. ඒ සමගින්ම කෝටි ගණනකින් සුළු පිරිසක් වන සහ දීර්ඝ කාලයක් නැතිව සිට දැන් හමු වූ ඒ සුළු පිරිසෙන් අතලොස්සක් වන, බ්‍රහ්මින් ජීවිතය ලබා ඇති ජීවාත්මයන්ට, බාප්දාදාගේ පිවිතුරු සිතිවිලි ඉටු කරන ජීවාත්මයන්ට, සංගම යුගී බ්‍රහ්මින් දිවියේ දේපළට සම්පූර්ණ අයිතියක් හිමි කරගන්නා ජීවාත්මයන්ට, භාග්‍යය පිරිනමන්නා සහ ආශිර්වාද පිරිනමන්නා වන බාප්දාදාගෙන් බොහෝ සෙනෙහස සහ සිහි කිරීම කාරුණිකව පිළිගන්න.

දාදි ජන්කි සහ දාදී චන්ද්‍රමනී, සේවය සඳහා පිටත්ව යාමට, බාප්දාදාගෙන් සමුගැනීම

ඔබ යනවාද නැත්නම් ඔබ බාප්දාදාව තමන් තුළ මුසු කරගන්නවාද? ඔබ ගියත්, ආවත් ඔබ සෑම විටම සිටින්නේ මුසුවීය. විශේෂ දරුවන් වෙන්ව සිටින ලෙස, බාප්දාදා කිසි විටෙක නොදකියි. සූක්ෂම ස්වරූපයකින් හෝ භෞතික ස්වරූපයකින් වුවද, ඔබ සෑම විටම සිටින්නේ බාබා සමගයි, මන්ද, සෑම මොහොතකදීම පරම පියා සමග සිටීමේ සහ ඔහුත් සමග ආපසු යාමේ පොරොන්දුව ඉටු කරන්නේ මහාවීර දරුවන් පමණයි. මෙම පොරොන්දුව ඉටු කරන්නේ ඉතා ටික දෙනෙකි. මේ නිසයි, එවන් විශේෂ ආදරණීය මහාවීර දරුවන් කොහේ ගියත්, ඔවුන් පියාව ඔවුන් සමග ගෙන යන අතර පියා ඔවුන්ව සෑම විටම සූක්ෂම දේශයේ ඔහු සමග තබාගනී. ඔහු සෑම පියවරකදීම ඔහුගේ ඇසුර ලබා දෙයි. එබැවින් ඔබ කියන්නේ කුමක්ද? ඔබ යනවාද, එනවාද? මේ නිසයි, ඔබ යනවද, නැත්නම් බාබාව ඔබ තුළ මුසු කරගන්නවාද කියා බාබා විමසුවේ? මේ ආකාරයෙන් සෑම විටම ඒකාබද්ධව සිටීමෙන්, ඔබ සමාන බවට පත් වී මුසු වෙයි. ඔබ කෙටි කලක් නිවහනේ විවේක ගෙන, පරම පියා සමග හිඳ, ඉන්පසුව පියා ඉහළ සිට බලා සිටින අතර, ඔබ රාජධානිය පාලනය කරයි, නමුත් ඔබ කෙටි කාලයකට ඔහුගේ ඇසුරේ සහකාරිත්වය අත්දකියි. අච්චා.

(බාබා, ඔබ අද ආශ්චර්යමත් මාලාවක් නිර්මාණය කළා). ඔය මිනිසුන්ද මාලාවක් නිර්මාණය කරනවා නේද? මාලාව තවමත් කුඩාය විශාල එකක් නිර්මාණය වෙයි. දැන් ටිකක් සිහිසුන් වී සිටින අයට, සොබාදහම හෝ කාලය විසින් කෙටි කාලයකින් නැවත සිහිය ලබා දෙයි. එවිට මාලාව විශාල වෙයි. අච්චා. ඔබ කොහේ ගියත් ඔබට දැනටමත් පියාගෙන් ආශිර්වාද ලැබී තිබේ. ඔබගේ සෑම පියවරකින් සියලු දෙනාටම පරම පියාගෙන් ආශිර්වාද නොකඩවා ලැබෙයි. ඔබ ඔවුන් දෙස බලන විට, ඔබගේ දෘෂ්ඨිය තුළින් ඔවුන් පරම පියාගේ ආශිර්වාද ලබා ගනී. ඔබ කතා කරන විට, ඔවුන් ඔබගේ වචන වලින් ආශිර්වාද ලබා ගනී, එමෙන්ම ඔබගේ ක්‍රියා තුළින්ද ඔවුන් ආශිර්වාද ලබා ගනී. ඔබ ඇවිදින විට සහ එහෙ මෙහෙ යන එන අතර ඔවුන් මත ආශිර්වාද වස්සනු ඇත. දැන් පැමිණෙන සියලුම ජීවාත්මයන්ට ආශිර්වාද සහ මහා දානය අවශ්‍යයි. ඔබ පිටත්ව යෑම යනු, විවෘත හදවතකින් ඔවුන්ට පරම පියාගේ ආශිර්වාද ලබා දීමයි. අච්චා.

**වරදානය:** ඔබ, ඔබගේ බුද්ධියේ පාදය, පංච මහා භූතයන්ගේ ආකර්ෂණයෙන් එපිට තබා ඇති, සුරදූතයෙක් වේවා.

සුරඟනන්ව සෑම විටම පෙන්වන්නේ ආලෝකමත් සිරුරකින්ය. ආලෝකමත් සිරුරක් ඇති අය, තම සිරුරේ අවධානය ඉක්මවා සිටියි. ඔවුන්ගේ බුද්ධියේ පාදය, පංච මහා භූතයන්ගේ ආකර්ෂණය ඉක්මවා සිටියි, එනම්, ඔවුන් එපිට රැඳී සිටියි. මායාටට හෝ මායා සමග සම්බන්ධකමක් ඇති කිසි දේකට එවන් සුරදූතයන්ව ස්පර්ෂ කළ නොහැක. කෙසේවෙතත්, මෙය සිදුවන්නේ ඔබ කිසිම කෙනෙක් මත කිසිම විටෙක යැපී නොමැති විටයි. ඔබගේ සිරුර මත අයිතියක් ඇතිව මෙන්ම මායා මතද අයිතියක් ඇතිව ගමන් කරන්න. ඔබගේ ලෞකික හෝ අලෞකික සම්බන්ධතා වලදී, කිසිම ආකාරයක යැපීමක් ඇති කර නොගන්න.

**පාඨය:** ඔබට සිරුරු දෙස බැලීමේ පුරුද්ද තිබේ නම්, ආලෝකමත් සිරුර දෙස බලා, ආලෝක ස්වරූපයේ ස්ථාවරව රැඳී සිටින්න.

***** ඕම් ශාන්ති *****